චක්‍රලේඛ අංකය : 1996/19

# අන්තර් පාරිවේණික භාෂා - සාහිත්‍ය තරගාවලිය සඳහා නිර්දේශ පත්‍රය

(1996 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක වේ.)


පිරිවෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
බත්තරමුල්ල.

## අන්තර් පාරිවේණික භාෂා – සාහිත්‍ය තරගාවලිය

බහු ජන හිතසුව පිණිස කැපවුණු පෞරුෂයක් සංවර්ධනය කරනු පිණිස යොමුවුණු සාම්ප්‍රදායික ජාතික අධ්‍යාපන ක්‍රියාවලියක් පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක වේ.

මේ අධ්‍යාපන මාර්ගයට පිවිස තම ජීවිත හැඩ ගසා ගන්නා ගිහි- පැවිදි ශිෂ්‍යයනට මානව සංහතියේ යහපත උදෙසා තම ජීවිත කැපකිරීමට අවශ්‍ය වන කුශලතා හැඳින ගැනීමට හා ඔප මට්ටම් කර ගැනීමට උපකාර කරගත හැකි නිදහස් වේදිකාවක් පිළියෙළ කරදීම අවශ්‍ය වේ.

ඒ සඳහා ක්‍රියාත්මක වන එක් ව්‍යාපෘතියක් සේ මේ අන්තර් පාරිවේණික භාෂා – සාහිත්‍ය තරගාවලිය දියත් කර ඇත.

පාරිවේණික, දිස්ත්‍රික් හා සමස්ත ලංකා යන මට්ටම් තුනකින් ක්‍රියාත්මක වන මෙම තරගාවලිය ගිහි – පැවිදි ශිෂ්‍යයනට උපරිම ප්‍රයෝජනයක් අත්වන සේ හා සෑම තරගයකදී ම සාධාරණත්වය ඉටුවන සේ ක්‍රියාත්මක වනු දැකීම සැමගේ සතුටට හේතු වනු ඇත.

එම්. ඩී. ඩී. පීරිස්,
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

D 040837 – 1,000 (96/09)

## තරග සංඛ්‍යාව

අන්තර් පාරිවේණික භාෂා සාහිත්‍ය තරගාවලිය තුළ ක්‍රියාත්මක වන තරග සංඛ්‍යාව පහත දැක්වේ.

| අනු අංකය | තරගය | පූර්ව ප්‍රාථමික | ප්‍රාථමික | කණිෂ්ඨ | ජ්‍යෙෂ්ඨ | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 01. | සිංහල කථික | X | X | X | X | 04 |
| 02. | පාලි කථික | | | X | X | 02 |
| 03. | සංස්කෘත කථික | | | X | X | 02 |
| 04. | ඉංග්‍රීසි කථික | | | X | X | 02 |
| 05. | ආගමික වැඩ මෙහෙයුම | X | X | X | X | 04 |
| 06. | දේශන කුශලතා | X | X | X | X | 04 |
| 07. | ගායනා | X | X | – | – | 02 |
| 08. | සිංහල ගද්‍ය රචනා | X | X | X | X | 04 |
| 09. | පාලි ගද්‍ය රචනා | | | X | X | 02 |
| 10. | සංස්කෘත ගද්‍ය රචනා | | | X | X | 02 |
| 11. | ඉංග්‍රීසි ගද්‍ය රචනා | | | X | X | 02 |
| 12. | අත්අකුරු | X | X | X | X | 04 |
| 13. | බෞද්ධ චිත්‍ර | X | X | X | X | 04 |
| 14. | සිංහල පද්‍ය රචනා | | | X | X | 02 |
| 15. | පාලි පද්‍ය රචනා | | | | X | 01 |
| 16. | සංස්කෘත පද්‍ය රචනා | | | | X | 01 |
| 17. | නිර්මාණ කුශලතා | | | X | X | 02 |
| 18. | සිංහල භාෂාඥාන | | | X | X | 02 |
| 19. | පාලි භාෂාඥාන | | | X | X | 02 |
| 20. | සංස්කෘත භාෂාඥාන | | | X | X | 02 |
| 21. | සාහිත්‍ය ඥාන | | | X | X | 02 |
| 22. | ත්‍රිපිටක ධර්මඥාන | | | X | X | 02 |
| 23. | ත්‍රිපිටක භාණක | | | X | X | 02 |
| | මුළු තරග | 07 | 07 | 20 | 22 | 56 |

පූර්ව ප්‍රාථමික අංශය සඳහා මූලික පිරිවෙනේ 1, 2, 3 වසර වල සිසුන්ද ප්‍රාථමික අංශය සඳහා මූලික පිරිවෙනේ 4, 5 වසරවල හා විද්‍යායතන පිරිවෙන්වල 9, 10, 11 වසරවල සිසුන්ද කණිෂ්ඨ අංශය සඳහා ප්‍රාචීන ප්‍රාරම්භ හා අ.පො.ස.(අ.පෙළ) පාඨමාලා හදාරණ සිසුන්ද ජ්‍යෙෂ්ඨ අංශය සඳහා ප්‍රාචීන මධ්‍යම, අවසාන හා විශ්ව විද්‍යාලීය පාඨමාලා හදාරණ සිසුන්ද සහභාගි විය යුතුය.

නිර්දේශය

01.0 කථික තරගය

අරමුණ : කිසියම් මාතෘකාවකට අදාළ ලෙස අදහස් පෙළගැස්වීමේ හැකියාව සහ එම අදහස් උචිත නිගමනයක් කරා, කුළුගැන්වීමේ හැකියාව වර්ධනය කිරීම.

02. චතුර වාග් ශක්තියක් දියුණු කරගැනීමට හා පුළුල් දැනුම් සම්භාරයක් රැස්කර ගැනීමට පෙළඹවීම.

කුශලතා
විනාඩි පහකට පළමු කුසපත් ඇදීමෙන් ලබා ගන්නා මාතෘකාවක් යටතේ විනාඩි පහක් තුළ සාරවත් තර්කානුකූල ව්‍යක්ත කථාවක් උචිත අභිනය දක්වමින් ඉදිරිපත් කළ යුතුය.

ලකුණු

| | |
|---|---|
| 1. අදාළ සාරවත් කරුණු | 15 |
| 2. තර්කානුකූල බව | 10 |
| 3. අභිනය | 05 |
| 4. කුළුගැන්වීම | 10 |
| 5. නියමිත කාලයට පිඩු කිරීම | 10 |
| මුළු ලකුණු | 50 |

02.0 ආගමික වැඩ මෙහෙයුම

අරමුණ : ශාසනික අවශ්‍යතා ශ්‍රාවක ප්‍රසාදය වැඩිවන අයුරින් ඉටු කිරීමට අවශ්‍ය ශාසනික ව්‍යවහාර කෞශල්‍යය දියුණු කර ගැනීම.

කුශලතා
ශ්‍රී ලාංකික ශාසනික සම්ප්‍රදායයන්ට අයත් විවිධ ආගමික මෙහෙයන් අතරින් නියම කරනු ලබන ආගමික මෙහෙයක් පටිපාටිගත පිළිවෙළ හා සම්ප්‍රදාය උල්ලංඝනය නොකර, කිරීමේ හා කරවීමේ හැකියාව ප්‍රකට කළ යුතුය. තිසරණ පන්සිල්හි පිහිටුවීම, දේවතාරාධනය, නමස්කාර ගාථා කීම අදාළ උදාහරණයි.

ලකුණු

| | |
|---|---|
| 1. පටිපාටිගත පිළිවෙල නොබිඳීම | 10 |
| 2. සම්ප්‍රදාය සුරැකීම | 10 |
| 3. ප්‍රසාදය ජනිත කිරීම | 10 |
| 4. ශ්‍රවන රමණීයත්වය | 10 |
| 5. ශ්‍රමණ සාරූප්‍යය | 10 |
| මුළු ලකුණු | 50 |

03.0 දේශන කුශලතා

අරමුණ : ශ්‍රී ලාංකික භික්‍ෂූන් වහන්සේලා විසින් පරපුරින් පරපුරට නොවරදවා පවත්වා ගෙන එනු ලබන දේශනා සම්ප්‍රදායන්ට අයත්, විහාර අස්න කීම, අනුශාසනාව, පරිත්‍රාණ ධර්ම දේශනාවෙහි විවිධ අවස්ථා, නමස්කාර ගාථා, ජාතක දේශන, ශාසනික කුශලතා වර්ධනය කර ගැනීමට පෙළඹවීම.

කුශලතා

විහාර අස්න කීම, අනුශාසනාව, පරිත්‍රාණ ධර්ම දේශනාවෙහි විවිධ අවස්ථා, නමස්කාර ගාථා ආදී සම්ප්‍රදායික දේශන සම්ප්‍රදායය උල්ලංඝනය නොකර මධුර ස්වරයෙන් නියමිත විධි නොඉක්මවා මංජුඝෝෂයෙන් යුතුව ගායනය කළ යුතුය.

ලකුණු

| | | |
|---|---|---|
| 1. | සම්ප්‍රදායානුකූලත්වය | 15 |
| 2. | ශ්‍රැති රම්‍යත්වය | 15 |
| 3. | ප්‍රසාද ජනනය | 10 |
| 4. | ශාසන ගෞරවය රැකෙන අයුරින් ඉදිරිපත් කිරීම | 10 |
| | | 50 |

කාලය

තරගකරුවකු සඳහා විනාඩි 7ක කාලයක් වෙන්වේ.

04.0 ගායනා

අරමුණ : සම්ප්‍රදායානුකූල ගායන විලාශයන් හැඳින ගනිමින් ඒ පිළිබඳ කුශලතා වර්ධනය කර ගැනීම හා එකී සම්ප්‍රදායයන් ජාතික උරුමයන් සේ හැඳින ඒවා රැකගැනීමට පෙළඹවීම.

කුශලතා

සිංහල පද්‍යයක්, සංස්කෘත ශ්ලෝකයක් හා පාලි ගැටළුවක් කාලය නොබිඳ මධුරස්වරයෙන් ශ්‍රවනීය ලෙස ගායනා කළ යුතුය.

ලකුණු

| | | |
|---|---|---|
| 1. | ශ්‍රවණ මාධූර්යය | 10 |
| 2. | නිවැරදි ශුද්ධ වචන උච්චාරණය | 10 |
| 3. | හැඟීම් දැනවීම | 10 |
| 4. | සම්ප්‍රදාය රැකෙනසේ ගැයීම | 10 |
| 5. | ස්මරණ ශක්තිය | 10 |
| | | 50 |

කාලය

එක් තරගකරුවකු සඳහා විනාඩි 7 කි.

05.0 ගද්‍ය රචනා

අරමුණ : නියමිත මාතෘකාවක් යටතේ සාරවත් කරුණු ගොනු කරමින් තර්කානුකූල අන්‍යොන්‍යවූත් බද්ධතාවකින් යුතුව ව්‍යක්ත ලෙස ව්‍යාකරණ දෝෂයන්ගෙන් තොර ස්වීය දාරකින් රචනයක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම.

02. ලේඛන කෞශල්‍යය දියුණුකර ගැනීමට හා පුළුල් දැනුම් සම්භාරයක් රැස්කර ගැනීමට පෙළඹවීම.

කුශලතා

දෙනු ලබන මාතෘකා කීපයකින් තෝරා ගන්න එක් මාතෘකාවක් යටතේ පැයක කාලය තුළ මාතෘකාවට අදාළ සාරවත් කරුණු තර්ක ප්‍රතිබදව ලෙස සංකේන්ද්‍රය කරමින් පාඨක බුද්ධි ප්‍රබෝධයට හේතුවන අන්දමින් කුළුගන්වමින් ලේඛක අනන්‍යතාව ප්‍රකට වන අයුරින් රචනයක් කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

ලකුණු

| | | |
|---|---|---|
| 1. | මාතෘකාවට අදාල සාරවත් කරුණු | 10 |
| 2. | තර්ක ප්‍රතිබද්ධතාව | 10 |
| 3. | ව්‍යාකරණාදිදෝෂ රහිත බව | 10 |
| 4. | ලේඛක දක්ෂතා ලක්ෂණ | 10 |
| 5. | කුළුගැන්වීම | 10 |
| | | 50 |

කාලය

පැයකි.

06.0 අත් අකුරු

අරමුණ : සිංහල, ඉංග්‍රීසි, සංස්කෘත අකුරු නිවැරදි ලෙසත්, ලක්ෂණටත් ලිවීමේ හැකියාව වර්ධනය කිරීමේ හා නිවැරදි ලෙස පද බෙදමින් විරාම ලක්ෂණ භාවිත කරමින් නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතුව සිංහල ඉංග්‍රීසි හා සංස්කෘත ගද්‍ය පද්‍ය පාඨ ලිවීමේ හැකියාව වර්ධනය කිරීම.

කුශලතා

දෙනු ලබන ගද්‍ය පද්‍ය පාඨ පද බෙදා විරාම ලක්ෂණ භාවිත කරමින් නිවැරදි අක්ෂරවින්‍යාසය ඇතිව නියමිත හැඩයෙන් හා පරිපූර්ණ බවින් යුතු අකුරින් ලිවීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

ලකුණු

| | | |
|---|---|---|
| 1. | අකුරුවල පරිපූර්ණ බව හා හැඩය | 20 |
| 2. | අක්ෂර වින්‍යාසය | 10 |
| 3. | පදබෙදීම | 05 |
| 4. | විරාම ලක්ෂණ හා විනය | 05 |
| 5. | ලියන ලද පාඨවල ආකෘතික සුන්දරත්වය | 10 |
| | | 50 |

කාලය

විනාඩි 45 කි.

07.0 බෞද්ධ චිත්‍ර

අරමුණ : ශ්‍රී ලාංකිකයන්ගේ ඓතිහාසික උරුමයක් වූ අනුරාධපුර යුගය දක්වා දිවයන බෞද්ධ චිත්‍රකලා සම්ප්‍රදාය පිළිබඳ ප්‍රබුද්ධ ආකල්පයක් ඇති කිරීම සහ චිත්‍රකලාව පිළිබඳව කුශලතා ප්‍රබුද්ධ කොට වර්ධනය කර ගැනීමට යොමු කිරීමත් දේශීය චිත්‍රකලා සම්ප්‍රදාය හා නිර්මාණ රැකගැනීමට පෙළඹීමක් ඇති කිරීමත් අරමුණු කෙරේ.

කුශලතා

බෞද්ධ තේමාවක් ගැබ්වුණු මාතෘකා අතරින් තෝරාගනු ලබන මාතෘකාවක් කැමති මාධ්‍යයක් භාවිත කරමින් චිත්‍රයට නැගීම හා චිත්‍ර ශිල්පකලා පිළිබඳ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීමට අපේක්ෂකයනට සිදුවේ. චිත්‍රය 18" x 12" ප්‍රමාණයේ කඩදාසියක් පැය දෙකක් තුළ නිමකළ යුතු අතර ප්‍රශ්න පත්‍රය සඳහා විනාඩි 30 ක කාලයක් වෙන් වේ.

ලකුණු

| | | |
|---|---|---|
| 1. | චිත්‍ර නිර්මාණය | 70 |
| 2. | ප්‍රශ්න පත්‍රය | 30 |
| | | 100 |

08.0 පද්‍ය රචනා

අරමුණ : භාෂා කෞශල්‍යයේ අග්‍රඵලය සේ සැලකෙන පද්‍යකරණය පිළිබඳ ශ්‍රී ලාංකිකයා තුළ ආදියේ සිටම පැවති කුශලතාව ඉදිරියටත් වර්ධනය කර ගැනීමට හා දියුණු කර ගැනීමට අවස්ථාව සැලසීමේ කරුණා, මෛත්‍රී ආදී බෞද්ධ හැඟීම් කුළුගන්වා රචනා කිරීමේ හැකියාව වර්ධනය කිරීම.

කුශලතා

සිංහල පද්‍ය රචනයේ දී භාවිත වන තෝටක යහගී සමුද්‍රඝෝෂ ආදි වෘත්තයන් ගෙන්ද පාලි සංස්කෘත පද්‍යකරණයේදී භාවිත වන මාලනී, දොධක, වසන්තතිලකා, ඉන්ද්‍රවජ්‍රා, උපේන්ද්‍රවජ්‍රා ආදී වෘත්තයන්ගෙන් ද ප්‍රබන්ධ කිරීමේ හැකියාව අපේක්ෂා කෙරේ. පද්‍ය 6 කට නොඅඩුව පද්‍ය16 කට නොවැඩි පද්‍ය සංඛ්‍යාවක් රචනා කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. ශිෂ්‍යයා විසින් ආශ්‍රමයේදී හෝ නිවසේදී ලියන ලද ස්වතන්ත්‍ර නිර්මාණයක් ශිෂ්‍යයාගේම නිර්මාණයක් බවට පරිවේනාධිපති හිමියන් විසින් සහතික කොට තරගයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු වාචික පරීක්ෂණයකට ද මුහුණදිය යුතුය.

ලකුණු

| | | |
|---|---|---|
| 1. | වෘත්තය නොබිඳ රචනා කිරීමේ හැකියාව | 10 |
| 2. | බෞද්ධ හැඟීම් කුළුගැන්වීමේ හැකියාව | 20 |
| 3. | රසාත්මක තාවය | 10 |
| 4. | හරවත් බව | 10 |
| | | 50 |

09.0 නිර්මාණ කුශලතා

අරමුණ : ජීවන අත්දැකීම් බෞද්ධ දර්ශනය තුළින් පෝෂණය කොට රසාත්මක නිර්මාණයක් බවට පත්කිරීමේ හැකියාව වර්ධනය කිරීම. කෙටිකතා, නිර්මාණය පිළිබඳ ශිල්පීය ක්‍රම පිළිබඳ පරිචයක් ලබා ගැනීම.

කුශලතා

උචිත අත්දැකීමක් වටා භාවෝ පසමනය කරමින් රසෝද්දීපනය වන ලෙස කෙටිකථාවක් නිර්මාණය කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. ශිල්පීය ක්‍රම උපක්‍රම භාවිතයට ඇති කෞශල්‍යය අගය කෙරේ.